**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී 2022 වර්ෂයට අදාළව ඇස්තමේන්තු කර තිබුණු රු.1,500,000 ක මුද්දර ගාස්තු ආදායමක් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමෙන් ඉවත් කිරීම නිසා එම වටිනාකමෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් අඩු වී තිබුණි. | පිළිගන්නා බව | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | 2022 වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා අදාළ වන උසාවි දඩ රු.169,415 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ එම වටිනාකමෙන් වැඩිවී තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | යකාවැව ජල ව්‍යාපෘතියෙන් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම රු.366,190 ක් වුවත් එය රු.166,526 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව උසාවි දඩ ආදායම රු.3,221,920 ක් වුවත් උපලේඛනය අනුව එය රු.2,775,755 ක් වුයෙන් රු.446,165 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගන්නා බව. | අනුරූපී වාර්තා උපලේඛන සමඟ සැසඳිය යුතුය. |

**1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| සුසාන භූමි | 56,800,000 | පැවරුම් සහතික | පිළිගන්නා බව. | තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.8,847,011 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.1,444,662 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,269,000 | 863,370 | 863,370 | - | 1,136,400 | 1,054,950 | 1,054,950 | 0 |
| (ii) | කුලී | 12,870,665 | 11,025,542 | 10,008,894 | 5,986,695 | 12,599,100 | 10,753,122 | 10,691,032 | 4,970,047 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 410,500 | 321,900 | 321,900 | - | 2,410,603 | 1,241,216 | 832,819 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,291,517 | 7,547,010 | 413,0480 | 10,271,913 | 3,236,970 | 4,318,157 | 3,442,770 | 6,855,383 |
| | | 18,841,682 | 19,757,822 | 15,324,644 | 16,258,608 | 19,383,073 | 17,367,445 | 16,021,571 | 11,825,430 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| (i) | වසර ගණනාවක සිට පැවත එන වත්කම් ඒකක 15 කට අදාළව අයවිය යුතු රු.2,022,159 ක හිඟ බදු කුලී 2023 වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සභාවට අයත් කඩ කාමර වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා බිල්කිරීම රු.5,833,972 ක් වුවත් එයින් සියයට 44 ක් වූ රු.2,544,368 ක් ද, හිඟ කඩ කාමර කුලී වෙනුවෙන් අයවිය යුතු රු.1,613,538 කින් සියයට 70 ක් වූ රු.1,131,587 ක් ද අයකර ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | කැබිතිගොල්ලෑව බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ පිහිටි සභාවට අයත් කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති තක්සේරු කුලියට වඩා වැඩි කුලියක් අය කිරීමට මහ සභාවේ විශේෂ යෝජනාවක් මගින් තීරණය කර තිබීම නිසා ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීමෙන් කඩ කාමර 23 ක් නිෂ්කාර්යව පවතින අතර, සභාවට රු.1,200,000 ක කුලී ආදායමක් ද අහිමි වී තිබුණි. | -එම- | තක්සේරු දෙපාර්තමේන්තු කුලී වටිනාකමට බදු දීමට කටයුතු කළ යුතුය. |
| (iv) | කඩ කුලී නොගෙවන හා විවෘත නොකරන ලද කඩකාමර වෙනුවෙන් ගිවිසුම් අවලංගු කර නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | -එම- | නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේදී රු.410,500 ක බලපත්‍ර ගාස්තු ආදායමක් ලබාගැනීමට ඇස්තමේන්තුගත කර තිබුණු නමුත් මුදල් පදනම මත රු.321,900 ක ආදායමක් පමණක් රැස් කර ලේඛනගත කර තිබුණු බැවින් හිඟ ආදායම් හඳුනා ගැනීමට නොහැකි විය. | -එම- | සමීක්ෂණ වාර්තා වලට අනුකූලව ගාස්තුව නිවැරදිව අයකරගත යුතුය. |

**(ඇ) වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණ වාර්තාව අනුව 2023 වර්ෂය සඳහා රු.662,737 ක ආදායමක් අයකර ගැනීමට බිල්කර තිබුණු නමුත් සියයට 98 ක් වූ රු.649,037 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | යකාවැව ජල ව්‍යාපෘතියේ හිඟ ජල බිල්පත් වලින් සියයට 47 ක් වූ රු.83,836 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ජල සම්බන්ධතා 54 ක් සහිත යකාවැව ජල ව්‍යාපෘතියේ ජල ගාස්තු අයකිරීම 2023 වර්ෂයේ සිට සංශෝධනය කර තිබුණු නමුත් එම සංශෝධනය අනුව බිල්පත් සකස් කිරීම සිදුකර නොතිබුණි.විගණන නියැදි පරීක්ෂාව අනුව ජල සම්බන්ධතා 03 ක් සඳහා පමණක් රු.115,362 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. ඒ අනුව ඉතිරි ජල සම්බන්ධතා 51 සම්බන්ධයෙන් ද හිඟ ගාස්තු ගණනය කර අයකරගත යුතුව තිබුණි. | පිළිගන්නා බව. | සංශෝධිත ගාස්තු අයකරගත යුතුය. |
| (iv) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,221,920 ක් හා මුද්දර ගාස්තු රු.5,964,234 ක් විය. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නඩත්තු කරන නළ ළිං 108 ක් සම්බන්ධ නිවැරදි තොරතුරු සභාව සතුව නොතිබුණු අතර ඒවා සභාවේ වත්කමක් බවට ද හඳුනාගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි විස්තර ලේඛනගත කර යාවත්කාලීන කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව භාවිත කරමින් පවතින වාහන 19 ක් සභාව නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ ඉල්ලීමක් හෝ අවශ්‍යතාවයක් නොතිබියදී සභාව වෙත වාහන ලබාදීම සහ රියදුරන් නොමැතිවීම නිසා වාහන 04 ක් නිෂ්කාර්යව ගාල්කර තිබුණි. | -එම- | සභාවට උපරිම ඵලදායිත්වයක් ලැබෙන පරිදි වාහන භාවිතයට ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කළ යෝජනා 18 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර එම ව්‍යාපෘති වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම් ද සඳහන් කර නොතිබුණි. | පිළිගන්නා බව. | වාර්ෂිකව අයවැයවලට අනුකූල වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |